බාලවයස් ලිංගික අපයෝජනයන් සැලකූ විට, එය බාලවයස්කරුගේ කැමැත්ත මත සිදුවූ ලිංගික සබඳතාවයක් ද නැද්ද යන්න අදාළ නොවන්නේ, බාලවයස්කරුවෙකු යනු ලිංගික සබඳතාවයක් වැනි කරුණක් පිළිබඳව තීරණ ගත හැකි වයසක සිටින්නෙකු නොවන බැවිනි. එනිසා, එවැනි අවස්ථාවකදී වුවත් එය ව්‍යවස්ථාපිත ලිංගික අපරාධයක් ලෙසින් සැලකෙන අතර, ඊට නීතියෙන් දඬුවම් හිමිවේ. මෙසේ නීතියෙන් අපරාධයක් ලෙස සැලකෙන බාලවයස් ලිංගික අපයෝජනයක් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී ඊට මුහුණ පෑ බාලවයස්කරුට දෝෂාරෝපණය කිරීම ඔස්සේ, එවැනි අපරාධයන් පිළිබඳ වැරදි චිත්‍රයක් සමාජගත වීමට ඉඩකඩ ඇත.

හංවැල්ල ප්‍රදේශයේ බාලවයස්කාර පාසැල් දැරියක ලිංගික අපයෝජනයට ලක් කළ අය අත්අඩංගුවට ගැනීමට පොලිසිය දියත් කළ මෙහෙයුම සම්බන්ධයෙන් ඉරිදා මව්බිම පුවත්පතේ, "පාසල් දැරිය කෙළෙසූ පාදුක්කේ මිනිස් සත්තු කොටු කළ මෙහෙයුම" යන මැයින් පළ වී තිබූ ලිපිය මෙහිදී නිදසුන් ලෙස ගත හැක. මෙම ලිපියේ අන්තර්ගතය තුළ, "...ඇය දඩබ්බර ගති පැවැතුම් ඇති දැරියකි", "....ඇය එහිදීද සිය පෙම්වතා අතින් අපයෝජනයට ලක්වුවද ඇය ඊට අකමැත්තක් දැක්වූයේ නැත", "මීට (අපයෝජනයට) ඇගෙන් කිසිදු විරෝධයක් එල්ල නොවී තිබිණි" වැනි සඳහන් කිරීම් දක්නට ලැබිණි.

එසේ නම්,

1) බාලවයස් දැරියක් ලිංගික සම්බන්ධතාවයක් සඳහා තීරණ ගත හැකි වයසක නීත්‍යානුකූලව නොසිටින්නේ නම්, ලිංගික අපයෝජනයක් සඳහා ඊට ලක්වූ බාලවයස් දැරියට දෝෂාරෝපණය කිරීම කෙතරම් ආචාර ධාර්මික වාර්තාකරණයකට එකඟ වන්නේ ද?

2) එසේ ලිංගික අපයෝජනයන් සම්බන්ධයෙන් ඊට මුහුණ පෑ බාලවයස්කාරිනියට දොස් පැවරීම සහ වගකීම පැවරීම ඔස්සේ, මෙවැනි අපරාධයන් වඩාත් සාමාන්‍යකරණය වීමට ඉඩක් නොතිබෙන්නේ ද?

ලිංගික අපයෝජනයට මුහුණ පෑ බාලවයස්කරුවන්ට දෝෂාරෝපණය නොකරමු!